**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2020**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිති 01 හි 150 ඡේදය ප්‍රකාරව ආස්ථිත්වයේ නෛතික ස්වභාවය, මෙහෙයුම්වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන භාරකාර ඔප්පුව පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශයට අතුළත් කර ගැනීමට සටහන් කර ගතිමි | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, ස්ථාවර තැන්පතු තුනකට අදාළ ඉකුත් වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු 7,794,456 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 2020 මාර්තු මස කල්පිරෙන ලද රු.මිලියන 300 ක ස්ථාවර තැන්පතු වලට අදාළ පොලිය 2020 වර්ෂයේ මුදල් පදනම මත දක්වා ගිණුම්ගත කොට ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) අරමුදලින් ගොවි බැංකු ආරම්භ කිරීම සඳහා ලබාදී ඇති ණය මුදලේ ආරම්භක ශේෂය රු. 190,313,579 ක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී පොලී ගණනය කිරීමේදී එය රු.181,200,000 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් ණය පොලිය රු. 91,125 කින් අඩුවෙන් දක්වා තිබුණි. | එකග වන බව හා නිවැරදි කර ගැනීම සඳහා සටහන් කර ගතිමි. | මූල්‍ය වර්ෂයට අදාළ ගනුදෙනු නිවැරදිව හඳුනාගත යුතු වීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

----------------------------------------

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ගොවිසෙත ලොතරැයි ආදායම | 4,710,479,333 | 4,688,745,587 | 21,733,746 | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂ භාණ්ඩාගාරය මඟින් තහවුරු කරගැනීමට අදාළව ලිපි යොමු කළ ද මේ දක්වා පිලිතුරු ලැබී නොමැති අතර මේ වර්ෂයේ දී අදාළ වෙනස පිළිබඳව සොයා බලා කටයුතු කරමි. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

----------------------------------------

2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා දුන් පහත සඳහන් ශේෂයන් සනාථ කිරීම සඳහා එම ශේෂ ඉදිරියෙන් දක්වා තිබූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ). ණයගැති පාලන ගිණුම් - කෘෂිකාර්මික භාර අරමුදල | 7,923,175 | ණයගැති කාල විශ්ලේෂණය හා ශේෂ සනාථ කිරීම | භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා දුන් ශේෂ වන අතර අදාළ ණය ශේෂ අඛණ්ඩව අවසාන ගිණුම් තුළ නිරූපනය වේ .එනම් ගොවිසෙත අරමුදල , කොටස් ගිණුම, ගොවීන්ගේ තැන්පතු, යන මෙම ශේෂ අවසාන ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ)ණයගැතියෝ - නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් (ඌව) | 1,467,176 | ශේෂ සනාථ කිරීම | එම | එම |
| (ඇ)ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම | එම | පරීක්ෂා කර බලා තහවුරු කරගත යුතු වීම. |
| (ඇ) කොටස් ගිණුම | 591,965 | එම | එම | එම |
| (ඉ)ගොවිසෙත අරමුදල | 159,399,408 | එම | එම | ශේෂය සනාථ කර ගත යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ). දිස්ත්‍රික් කාර්යාල සහ ගොවි සමාගම් වෙත ලබාදී ඇති කෙටිකාලීන ණය ශේෂ අතර 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 ක සිට වර්ෂ 20 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබූ රු.27,502,498 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට ඵලදායි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | මෙසේ දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි තීරණ ගැනීමට කටයුතු කරමි. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ). පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3000 ක් පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය Good Agriculture Practice (GAP) අනුව 2018/2019 මහ කන්නයේ වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට ගොවීන්ගේ භාරකාර අරමුදලින් 2018 වර්ෂයේදී රු.මිලියන 5.9 ක පොලී රහිත ණයක් වසරක කාල සීමාවකින් ගෙවීමේ පදනම මත නිදහස් කර තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන් වෙනුවෙන් GAP සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළ ද 2020 වර්ෂය අවසන් වන විටත් ගෙවිලියන් වෙත GAP සහතික ලබා දී නොතිබූ අතර ව්‍යාපෘතිය නිමවිය යුතු කාලය අවසන් වී වසර 2 ක් ගතවී තිබුණ ද මේ සම්බන්ධව ලබා දී තිබූ ණය මුදල පියවීම් කර නොතිබුණි. | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සහල් සඳහා (GAP) සහතිකකරණය ලබාදීමේ වැඩසටහන සඳහා රු. 5,966,000 ක මුදලක් ලබා දෙන ලද අතර එම මුදල මේ දක්වා ගෙවා නොමැති බව පිළිගනිමි. මෙම මුදල අයකිරීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට ව්‍යාපෘතිය පිළිබඳ අධීක්ෂණ කටයුතු කරන ලද නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) වෙත දැනුම් දී ඇත. | ගෙවිලියන් වෙත GAP සහතික ලබා දිය යුතු අතර ණය මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ). "ප්‍රයිම් හර්බ් ලංකා" නැමැති පුද්ගලික සමාගම වෙත 2003 වසරේදී ලබාදී ඇති රු. 3,500,000 ක ණය මුදලින් රු.860,000 ක් තව දුරටත් අයවීමට පැවතුණි. මෙම සමාගම ව්‍යාපාරික කටයුතු නවතා ඇති බව හා ණය මුදල ලබා ගත් පුද්ගලයා මිය ගොස් ඇති බව අරමුදල වෙත දැනුම් දී ඇත. එබැවින් තව දුරටත් ණය ගෙවීමේ හැකියාව පිළිබඳව සාධාරණ පරීක්ෂාවක් සිදු කර අයකර ගැනීම හෝ ඉදිරි නීතිමය පියවර ගැනීම සම්බන්ධයෙන් කිසිඳු පියවරක් මේ වන තෙක් අරමුදල විසින් ගෙන නොතිබුණි. | නීති උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරමි. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ). 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී එම අරමුදල් දෙකෙහි පැවති හර හා බැර ණය ශේෂයන් ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරා දෙන ලදී. එහිදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.1.490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරීන් 10 දෙනෙකු පත් කර තිබූ නමුත්, තව දුරටත් අයකර නොගත් කෙටි කාලීන ණය මුදල රු.39,967,891 ක් විය. | දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි තීරණ ගැනීමට කටයුතු කරමි. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). 2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 03(ආ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එකඟ වෙමි. හා 2021 වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වීම. |
| (ආ). 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මු.රෙ. 877(2)(අ) ඡේදය | පනතක් නොමැති ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. එසේ වුවද සකස් කර ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතට මුදල් අමාත්‍යවරයාගේ අදහස් දැක්වීම් සමග නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස 2016 ඔක්තොම්බර් 19 දිනැති අංක අමප/16/1866/728/ 041 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තීරණය කර තිබූ නමුත් කරුණු සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කිරීමක් විගණිත දිනය දක්වා කර නොතිබුණි. | මෙම වසර අවසානයට පෙර පනත සම්මත කිරීමට අදාළ කටයුතු අවසන් කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 40,157,955 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,195,080 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,962,875 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රදර්ශන, බීජ නිශ්පාදන හා මීමැසි පෙට්ටි නිෂ්පාදනය වැනි ප්‍රාග්ධන ව්‍යාපෘති 44 ක් වෙනුවෙන් රු.916,322,319 ක් වෙන්කර තිබූ නමුත් ඒවායින් ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වර්ෂයේ ඉලක්ක කරන ලද ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. විශේෂයෙන්ම 2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදල වෙත ගොවිසෙත ලොතරැයියේ ආදායම ලැබී නොතිබුණු බැවින් අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමේ අභිලාෂය ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා රු.මි 369.8 ක මුදලක් ලබා දෙන ලෙස 2020 දෙසැම්බර් 09 දින මුදල් අමාත්‍යංශ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබීය. ඒ අනුව 2021 පෙබරවාරි 08 දින රු.මි 100 ක මුදලක් ලබා දෙන ලදි. | ගොවිසෙත ලොතරැයි ආදායම අරමුදලේ අරමුණ උදෙසා උපයෝජනය කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවන ලද 1994 මාර්තු 09 දිනැති භාරකාර ඔප්පුවේ 14 වන වගන්තිය ප්‍රකාරව භාරකාර අරමුදල සඳහා කාර්ය මණ්ඩලයක් බඳවා ගත හැකිව තිබූ නමුත් එසේ සිදු නොකිරීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම, නොපියවූ අත්තිකාරම් පැවතීම, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම, අරමුදලෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු නොකිරීම යනාදී දුර්වලතා හේතුවෙන් අරමුදලේ මූල්‍ය හා පරිපාලන කළමනාකරණය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | පනත සම්මත කිරීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලය අනුමත කිරීමට කටයුතු කරමි. | මූල්‍ය හා පරිපාලන කටයුතු මනාව කළමනාකරණය කළ යුතු වීම. |